කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

*වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය*

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011

2013 දෙසැම්බර්

## BMGT E1035 – ව්‍යාපාරික ආර්ථික විද්‍යාව

ප්‍රශ්න සංඛ්‍යාව : 08 (අටයි) කාලය : පැය 03 යි

**(ගණක යන්ත්‍ර භාවිතයට ඉඩදෙනු ලැබේ)**

(i) ප්‍රශ්න පත්‍රය කොටස් 03 කින් සමන්විත වේ. I කොටස, II කොටස හා III කොටස


(ii) පළමු කොටසට අදාළ සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතුය.

(iii) ඔබ වෙත පිළිතුරු සැපයීමට ලබාදී ඇති පත්‍රිකාවෙහි පළමු කොටසට අදාළ පිළිතුරු අදාල ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

(iv) දෙවෙනි කොටසින් හා තෙවන කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්වත් ඇතුලත්ව ප්‍රශ්න 04 ට පිළිතුරු සැපයිය යුතුය.

## I - කොටස

01.




නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර 1 (PPC1) මත පිහිටි M ලක්ෂය නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර 2 (PPC2) හි N ලක්ෂය දක්වා ගමන් කිරීමට පහතින් කුමන සංසිද්ධියක් බලපාන්නේද?

(අ) කෘෂිකාර්මික භාණ්ඩ හා කාර්මික භාණ්ඩ අතර වඩා කාර්යක්ෂම සම්පත් බෙදාහැරීමක්

(ආ) කෘෂිකාර්මික හා කාර්මික ක්ෂේත්‍රයන්හි වූ තාක්ෂණික දියුණුවක්

(ඇ) කෘෂිකාර්මික හා කාර්මික ක්ෂේත්‍රයන්හි සේවා වියුක්තියේ අඩුවීමක්

(ඉ) කෘෂිකර්මාන්තය සඳහා රාජ්‍ය සහනාධාරයන් හඳුන්වාදීමක්

02. ආහාර සහ නිවාස පමණක් පවතින ආර්ථිකයක අයවැය සංරෝධකයේ නිවැරදි ඉදිරිපත් කිරීම පහතින් පහතින් කුමක්වේද? මෙහි M = ආදායම, Pf = ආහාර මිල, $P_s$ = නිවාස මිල, S = නිවාස ප්‍රමාණය, සහ F = ආහාර ප්‍රමාණය

(අ) $M = P_f (S) + PS (F)$

(ආ) $S = M/P - P/P (F)$

(ඇ) $F = M(P) + P/P (S)$

(ඉ) ඉහත කිසිවක් නිවැරදි නොවේ.

03. ප්‍රසාරන මාර්ගයෙන් විස්තර වනුයේ,

(අ) විවිධ නිමවුම් මට්ටම් නිෂ්පාදනයට අවශ්‍ය අවම පිරිවැයක් සහිත යෙදවුම් සංයෝගයන්

(ආ) ආයතනයේ යෙදවුම් සඳහා වූ ඉල්ලුම් වක්‍රය

(ඇ) දෙනලද නිමවුම් මට්ටමක් නිෂ්පාදනයට අවශ්‍ය විවිධ යෙදවුම් සංයෝගයන්

(ඉ) ඉහතින් සඳහන් සෑම වගන්තියකින්ම එය විස්තර කෙරේ.

04. මිල විශේෂීකරණයක් ක්‍රියාත්මක කිරීමට පෙර ඒ සඳහා අදාළ නොවන කොන්දේසියක් ලෙස විකුණුම් කරුවකු විසින් අවශ්‍යයෙන්ම අවබෝධ කරගත යුතු පහත සඳහන් සංසිද්ධීන්ගෙන් කුමන සංසිද්ධියක්ද?

(අ) ගැණුම් කරුට නිෂ්පාදිතය නැවත විකිණිය නොහැකි විය යුතුය.

(ආ) නිෂ්පාදිතය සේවාවක් විය යුතුය.

(ඇ) විකුණුම්කරු සතුව සැලකියයුතු ඒකාධිකාරී බලයක් තිබිය යුතුය.

(ඉ) විකුණුම් කරුට වෙළඳපල ඛණ්ඩනය කිරීමේ හැකියාවක් තිබිය යුතුය.

05. කතිපයාධිකාරී වෙලදපලක විකුණනු ලබන භාණ්ඩයක මිල, ව්‍යවර්ථිත ඉල්ලුම් වක්‍ර ආකෘතියට අනුව පුරෝකථනය කළ විට,

(අ) විශාල වශයෙන් උච්ඡාවචනය වීමේ ප්‍රවණතාවයක් ඇත.

(ආ) පිරිවැයෙහි හා ඉල්ලුමෙහි ඇතිවන කුඩා වෙනස්කම් වලට ප්‍රතිචාර නොදක්වන අතර මිල නොවෙනස්ව පැවතීමේ ප්‍රවනතාවයක් ඇත.

(ඇ) වෙළඳපලෙහි පවතින විශාලතම ආයතනය විසින් තීරණය කරනු ලබයි.

(ඉ) කාටලය මඟින් පාලනය කරනු ලබයි.

06. ප්‍රසාරණාත්මක මූර්ත ප්‍රතිපත්තීන්හි ප්‍රතිඵලය වන්නේ,

(අ) $G\uparrow \rightarrow AD\uparrow \rightarrow IS$ වක්‍රය වමට විතැන්වීම $\rightarrow Y\uparrow \rightarrow mt\uparrow \rightarrow msp\downarrow \rightarrow r\uparrow$

(ආ) $G\uparrow \rightarrow AD\downarrow \rightarrow IS$ වක්‍රය දකුණට විතැන්වීම $\rightarrow Y\downarrow \rightarrow mt\downarrow msp\uparrow \rightarrow r\uparrow$

(ඇ) $G\uparrow \rightarrow AD\uparrow \rightarrow IS$ වක්‍රය දකුණට විතැන්වීම $\rightarrow Y\uparrow \rightarrow mt\uparrow \rightarrow msp\downarrow \rightarrow r\uparrow$

(ඉ) $G\uparrow \rightarrow AD\uparrow \rightarrow IS$ වක්‍රය දකුණට විතැන්වීම $\rightarrow Y\uparrow \rightarrow mt\downarrow \rightarrow msp\downarrow \rightarrow r\downarrow$

07. රජයේ වියදම්වල ඉහළයාමක් මඟින් IS වක්‍රය (r· $\triangle$ G ප්‍රමාණයෙන් දකුණට විතැන් කරනු ලැබේ. (D යනු වියදම් ගුණකයයි) මෙහිදී නිෂ්පාදනයේ සැබෑ ලෙස ඇතිවන වෙනස IS වක්‍රය විතැන්වීමේ ප්‍රමාණයට බෙහෙවින් ආසන්න අගයක් ගන්නේ,

(අ) LM වක්‍රය සාපේක්ෂකව පැතලි හැඩයක් හා IS වක්‍රය දල බෑවුමක් සහිත වන විට

(ආ) LM වක්‍රය සිරස් හැඩයක් හා IS වක්‍රය දල බෑවුමක් සහිත වන විට

(ඇ) IS හා LM වක්‍ර සාපේක්ෂකව පැතලි හැඩයක් ගන්නා විට

(ඉ) LM වක්‍රය දල බෑවුමක් සහිත වන විට සහ IS වක්‍රය සාපේක්ෂකව පැතලි හැඩයක් ගන්නා විට

08. එක්තරා ආර්ථිකයක නිර්යාත වටිනාකම රු. බිලියන 40 ක්ද ආයාත වටිනාකම රු. බිලියන 175 ක් ද පාරිභෝගික පැහැදමෙහි වටිනාකම රුපියල් බිලියන 2343 ක්ද, දල ආයෝජනය රු. බිලියන 379 ක්ද, රාජ්‍ය වියදම රු. බිලියන 865 ක්ද, වේ. ඒ අනුව මෙහි දල ජාතික නිෂ්පාදිතයෙහි (GDP) අගය සමානවිය යුත්තේ,

(අ) රු. බිලියන 3722

(ආ) රු. බිලියන 3452

(ඇ) රු. බිලියන 3802

(ඉ) ප්‍රමාණවත් දත්ත නොමැති බැවින් ද. ජා. නි. ගණනය කල නොහැක.

09. පසුගිය වසරේ පුද්ගලයකු සතුව රු. 20,000 ක ආදායමක් වූ අතර ඔහු රු. 10,000 ක බදු ප්‍රමාණයක් ගෙවන ලදි. මෙම වසරේ, එම පුද්ගලයා සතුව රු. 100, 000 ක ආදායමක් ඇති අතර ඔහු රු. 30, 000 ක බද්දක් ගෙවා ඇත. මෙම පුද්ගලයාගේ ආන්තික බදු අනුපාතිකය,

(අ) 25%

(ආ) 30%

(ඇ) 50%

(ඉ) 100%

10. චක්‍රීය සේවා වියුක්තිය යනු,

(අ) තාවකාලික සේවාවියුක්තව සිටින නමුත් සේවානියුක්ත වීමට හැකියාවක් ඇති පුද්ගලයන්ගෙන් සමන්විත වූ ශ්‍රම බලකා කොටස

(ආ) ව්‍යාපාර චක්‍රයන්ගේ සිදුවන උච්චාවචනයන් නිසා සේවා වියුක්ත වන පුද්ගලයන්ගෙන් සමන්විත වූ ශ්‍රම බලකා කොටස

(ඇ) වැඩ කිරීමට කැමැත්තක් ඇති නමුත් කුසලතාවයන්ගේ හා වැඩ කිරීමේ අත්‍යවශ්‍යවන අනෙකුත් ගති ලක්ෂණයන්ගේ ප්‍රමාණවත් බව අඩු වීම නිසා සේවා වියුක්ත වන පුද්ගලයන්ගෙන් සමන්විත වූ ශ්‍රම බලකා කොටස

(ඉ) ස්වභාවික සේවා වියුක්ති අනුපාතිකය

(එක් කොටසකට 01
බැගින් ලකුණු 10)

එක් එක් ප්‍රශ්නය සඳහා අදාළ පිළිතුරු සපයා ඇති ඉඩෙහි සඳහන් කරන්න.

11. උපේක්ෂා වක්‍රයක ලක්ෂණයන් මොනවාද?

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

12. ප්‍රශස්ථ ධාරිතා මට්ටම යනු,

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

13. LM ශ්‍රිතය පොලී අනුපාතිකය සඳහා ව්‍යුත්පන්න කරන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

14. ''පූර්ණ තෙරපුම් ප්‍රතිවිපාකය'', ''තෙරපුම් ප්‍රතිවිපාකයක් නොමැති අවස්ථාවෙන්'' වෙන් කර දක්වන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

15. සැඟවුනු සේවා වියුක්තිය සහ සර්ෂක සේවා වියුක්තියෙහි වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

(එක් කොටසකට 02
බැගින් ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

## II - කොටස

02\. (අ) වෙළඳපල කොන්දේසි වඩා වැඩි විශ්වසනීයත්වයකින් යුතුව අවිනිශ්චිතතාවයන් හා අවදානම අවම කරමින් පුරෝකථනය කිරීමට ආර්ථීක විද්‍යාව මඟ පාදයි.'' ඉහත ප්‍රකාශය ආශ්‍රයෙන් කළමනාකරණ තීරණ ගැනීමේ ක්‍රියාවලියට ව්‍යාපාරික ආර්ථීක විද්‍යාව දායකවන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ආ) මාළු වෙළඳපල තුල සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණයට පහත සිද්ධීන් බලපෑම් කරන ආකාරය සැපයුම් සහ ඉල්ලුම් ප්‍රස්ථාර ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

i. මාළු අනුභව කරන්නන්ට පිළිකා වැළඳීමේ අවදානම අඩුබව අනාවරණය වූ බව විද්‍යාඥයන් විසින් ප්‍රකාශයට පත් කිරීම.

ii. රේඩාර් තාක්ෂණය මඟින් මාළු ඇල්ලීම වඩාත් පහසු කිරීම

(ලකුණු 04)

(ඇ) කෝපි මිල මට්ටම රු. 50 සිට රු. 70 දක්වා වෙනස් වූ විට විකුණනු ලැබූ තේ ප්‍රමාණය 2500kg සිට 5000kg දක්වා වැඩි විය. තේ සඳහා වන හරස් ඉල්ලුම් චාප නම්‍යතාවය ගණනය කරන්න. ඔබගේ පිළිතුර විවරණය කරන්න.

(ලකුණු 03)

(ඈ) ''බාල භාණ්ඩයක ආදායම් ප්‍රතිවිපාකය, ආදේශන ප්‍රතිවිපාකය අභිබවා ගියද සාමාන්‍ය භාණ්ඩයක් සඳහා මෙය එලෙසින් ආදේශනය කළ නොහැකිය.'' ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේද? එක් භාණ්ඩයක මිල ගණන් පහළ යනවිට සාමාන්‍ය භාණ්ඩයක මුළු ප්‍රතිවිපාකය ප්‍රස්ථාරිකව විදහා දක්වන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

03\. (අ) දිගුකාලීන හා කෙටිකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රයක් ප්‍රස්ථාරිකව නිරූපනය කර එම එක් එක් වක්‍රයන්ගේ හැඩය තීරණය වීම කෙරෙහි බලපාන සාධකයන් මොනවාදැයි දක්වන්න.

(ලකුණු 06)

(ආ) මුළු වියදම (TC) පහත ආකාරයට නිෂ්පාදිත ඒකක ප්‍රමාණය මත රදාපවතින බව උපකල්පනය කරන්න.

$$TC = a + bQ - cQ^2 + dQ^3$$

TFC, TVC, AFC, AVC, AC සහ MC ගණනය කරන්න.

(ලකුණු 03)

(ඇ) ආන්තික තාක්ෂණික ආදේශන අනුපාතිකය (MRTS), ආන්තික ආදේශන අනුපාතිකයෙන් (MRS) වෙනස්වන්නේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(ඉ) ''නිෂ්පාදන ශ්‍රිතයෙන් යෙදවුම් සහ නිමවුම අතර පවත්නා තාක්ෂණික සම්බන්ධතාවය විදා ්මාන වේ. කෙටිකාලයේදී අවම වශයෙන් එක් යෙදවුමක්වත් ස්ථාවර වන අතර, ආයතනයකට තම නිමවුම් ඉහළ දැමියයුතු නම්, ඒ සඳහා වූ එකම මාර්ගය විචල්‍ය සාධකයන් ප්‍රමාණය ඉහළ නැංවීමය.'' කෙටි කාලයේදී ප්‍රශස්ත නිමවුම් අදියර කුමක්දැයි අවධාරණය කරමින් ඉහත ප්‍රකාශය ප්‍රස්ථාරිකව විස්තර කරන්න.

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

04. (අ) පූර්ණ තරගකාරී වෙළඳපල ව්‍යුහයක් තුළ ක්‍රියාත්මක වන ආයතනයක කෙටිකාලීන සැපයුම් වක්‍රය ව්‍යුත්පන්න කරගන්නා ආකාරය සුදුසු ප්‍රස්ථාර සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) ඒකාධිකාරී තරඟකරුවකු අකාර්යක්ෂමය, යන්නෙහි වලංගුතාවය රඳාපවතින්නේ භාණ්ඩ විවිධාංගිකරණයෙන් ලැබෙන ප්‍රතිලාභය, භාණ්ඩ විවිධාංගීකරණයට දැරීමට සිදුවන පිරිවැයෙහි ඉහළයාම සමඟ සංසන්දනය කිරීමෙනි. ඒකාධිකාරී තරඟ වෙළඳපල පූර්ණ තරඟකාරී වෙළඳපල සමඟ සංසන්දනය කරමින් ඉහත ප්‍රකාශය සාධාරණීකරනය කරන්න.

(ලකුණු 06)

(ඇ) එක්තරා පූර්ණ තරඟකාරී ආයතනයක් මුහුණදෙන ඉල්ලුම් ශ්‍රිතය

$P = 1000 - 0.4Q$ වන අතර මුළු පිරිවැය ශ්‍රිතය $TC = 50Q + 20,000$ වේ.

(i) ආන්තික ප්‍රවේශය ඇසුරින් ලාභ උපරිම කරන නිමවුම් මට්ටම හා මිල ගණනය කරන්න.

(ii) මෙය ප්‍රස්ථාරිකව නිරූපනය කරන්න.

(iii) මෙම නිමවුම් මට්ටමේදී ආයතනය උපයන මුළු ලාභය /අලාභය සොයන්න.

(ලකුණු 09)

**(මුළු ලකුණු 20)**

05. (අ) එකිනෙකට වෙනස් වූ ඉල්ලුම් ශ්‍රිතයන් දෙකකට මුහුණ දෙමින් ඒකාධිකාරී ආයතනයක් වෙළඳපල දෙකකට තම නිෂ්පාදනයන් සපයනු ලබයි. ආයතනය මුහුණදෙන ඉල්ලුම් ශ්‍රිත 02 පහත දැක්වේ.

$Q_1 = 42 - 0.2P_1$

$Q_2 = 100 - 0.4P_2$

ආයතනයේ මුළු පිරිවැය ශ්‍රිතය,

$TC = 4000 + 20Q$

පහත දේ ගණනය කරන්න.

(i) වෙළඳපල දෙකට අදාළ වූ මිල සහ නිමවුම් මට්ටම

(ii) මුළු ලාභය

(ලකුණු 07)

(ආ) B භාණ්ඩය සඳහා වන වෙළඳපල තුල කටයුතු කරන එකම ආයතනය "xyz" යැයි උපකල්පනය කරන්න. "xyz" ආයතනයේ කෙටිකාලීන හා දිගුකාලීන සමතුලිතය ප්‍රස්ථාරිකව නිරූපනය කරන්න.

(ලකුණු 06)

(ඇ) නායකයකුගේ ඉල්ලුම් වක්‍රය ලෙස සැලකෙනුයේ අනෙකුත් සුළු ආයතන විසින් අසම්පූර්ණ කරන ලද පරාසය වන වෙළඳපල ඉල්ලුම් වක්‍රයෙන් කොටසකි. එය වෙළඳපල ඉල්ලුමෙන් අනෙකුත් සුළු ආයයතනයන්හි සැපයුම අඩු කිරීමෙන් ලබාගත හැක. ඉහත ප්‍රකාශය අනුව අනෙකුත් සුළු ආයතන විසින් තම සැපයුම තීරණය කරනුයේ කෙසේදැයි කෙටියෙන් දක්වන්න.

(ලකුණු 07)

**(මුළු ලකුණු 20)**

06. (අ) ආදායමේ චක්‍රාකාර ප්‍රවාහයට අනුකූලව "විදීම් කාන්දුවීම් සමානතාවය" ගොඩනගා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) ජාතික ආදායම ඇස්තමේන්තු කිරීමේදී මුහුණදීමට සිදුවන දුෂ්කරතාවයන් මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04)

(ඇ) කල්පිත ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත. (සියළු අගයන් රුපියල් මිලියන වලිනි)

$C = 140 + 0.6yd$ (පාරිභෝජනය)

$Tx = 50 + 0.3y$ (බදු ශ්‍රිතය)

$Tr = 70$ සංක්‍රාම)

$I = 300$ (ආයෝජන)

$G = 250$ (රාජ්‍ය වියදම)

$X = 420$ (අපනයන)

$m = 120+0.25y$ (ආනයන)

(i) මෙම ආකෘතිය සඳහා සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.

(ලකුණු 04)

(ii) පාරිභෝජනය, බදු සහ ආනයන සඳහා වන වටිනාකම් මොනවාද?

(ලකුණු 02)

(iii) ආන්තික පාරිභෝජන නැමියාව හා ආන්තික ඉතුරුම් නැමියාව අතර පවතින සම්බන්ධතාවය විදහා දක්වන්න.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

07. (අ) "සංකීර්ණ කේනසියානු ආකෘතියට අනුව භාණ්ඩ හා සේවා වෙළඳපල හා මුදල් වෙළඳපල අතර අන්තර් රැඳියාවක් පවතී". ඔබ මෙම ප්‍රකාශය සඳහා එකඟ වන්නේද? ඔබගේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

(ලකුණු 04)

(ආ) කල්පිත ආර්ථිකයක් සම්බන්ධව පහත දැක්වෙන් තොරතුරු ඔබ වෙත සපයා ඇත. (සංඛ්‍යා රුපියල් මිලියන වලිනි.)

$C = 100 + 0.8yd$ (පාරිභෝජනය)

$I = 300 - 30r$ (ආයෝජන)

$Tx = 200 + 0.2y$ (බදු ශ්‍රිතය)

$G = 400$ (රාජ්‍ය වියදම)

$Tr = 50$ (සංක්‍රාම)

$md = 0.3y - 12r$ (මුදල් ඉල්ලුම)

$MS = 150$ (මූර්ත මුදල් සැපයුම)

මූර්ත හා මූල්‍ය වෙළඳපල සමතුලිත වන අවස්ථාවේදී ජාතික ආදායම හා පොලී අනුපාතිකය ගණනය කරන්න.

(ලකුණු 04)

(ඇ) IS -LM ආකෘතිය භාවිතා කරමින්,

(i) මුදල් සැපයුමේ ප්‍රසාරණයක්

(ii) සංකෝචනාත්මක පිස්කල් ප්‍රතිපත්තියක බලපෑම පරීක්ෂා කරන්න.

(ලකුණු 04)

(ඉ) ආර්ථික ක්‍රියාකාරකම් හැසිරවීමෙහිලා වන මූලික තීරකය මුදල් ප්‍රමාණය බව මූල්‍ය වාදීන් තර්ක කරන අතර මූර්ත විචල්‍යයන් වඩාත් වැදගත්වන බව මූර්තමතදාරීන් අවධාරණය කරයි. මූර්ත හා මූල්‍ය ප්‍රතිපත්තීන්හි ඵලදායකත්වය තීරණය කෙරෙන සාධක සඳහන් කරමින් ඉහත ප්‍රකාශය IS-LM ආකෘතිය ආශ්‍රයෙන් විවේචනාත්මකව විමර්ශනය කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

08. (අ) රජය විසින් උද්ධමනය පාලනය කිරීමේ අරමුනින් යුතුව පාරිභෝගික භාන්ඩ හා සේවා සඳහා වන බදු ඉවත්කිරීමක්ද රාජ්‍ය වියදම අඩුවීමක්ද එකවර සිදුකරන ලදි. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම නිසා පොදු මිල මට්ටමට හා සමාහාර නිමවුමට ඇතිවිය හැකි බලපෑම කෙබඳුවේද? උද්ධමනය පාලනය කිරීම සඳහා ඔබ විසින් යෝජනා කෙරෙන විකල්ප ප්‍රතිපත්තීන් මොනවාද?

(ලකුණු 10)

(ආ) "සහස්‍ර ශතවර්ෂ අභිමතාර්ථයන්හි පළමු අභිමතාර්ථය වන කුසගින්න හා දිළිඳුකම පිටුදැකීම සඳහා ආර්ථික වර්ධනය අවශ්‍ය සාධකයක් වුවද ප්‍රමාණවත් සාධකයක් නොවන්නේය". කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**